ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022-11-17 |

පැමිණිලි පාර්ශවය : පි.එච්. අබේවික්‍රමසිංහ මහතා,
සාගම පාර,
අක්කරපත්තුව 08.

වගඋත්තර පාර්ශවය :

1. ප්‍රාදේශිය ලේකම්,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,
   අලයාඩිවෙම්බු.

2. ග්‍රාම නිළධාරි,
   කෝලාවිල් 01 වසම බාර,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,
   අලයාඩිවෙම්බු.

3. ස්ථානාධිපති,
   පොලිස් ස්ථානය,
   අක්කරෙයිපත්තුව.

4. දිස්ත්‍රික් ලේකම්,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
   අම්පාර.

<u>පැමිණිලි අංකය : **HRC/AM/43/18**</u>

ඉහත අංක දරණ පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2022.10.18 දිනැති නිර්දේශය හා බැඳේ.

එම නිර්දේශයේ, සිදුවූ යතුරුලියන දෝෂයක් හේතුවෙන් 3 වන වගඋත්තර පාර්ශවය ලෙස ස්ථානාධිපති, පොලිස් ස්ථානය, බගවන්තලාව නම් කර ඇති අතර, එය **ස්ථානාධිපති, පොලිස් ස්ථානය, අක්කරෙයිපත්තුව** ලෙස සංශෝධනය විය යුතු බවට කාරුණිකව දන්වා සිටිමි.

මේ හේතුවෙන් පාර්ශවයන් වෙත යම් අපහසුතාවයක් සිදුවූයේ නම් ඒ පිළිබඳව කොමිෂන් සභාවේ කණගාටුව ප්‍රකාශ කරන බවද දන්වමි.

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- ස්ථානාධිපති, පොලිස් ස්ථානය, බගවන්තලාව. - දැ.ගැ.පි

B/

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-10-18 |

පැමිණිලි පාර්ශවය : පි.එච්. අබේවික්‍රමසිංහ මහතා,
සාගම පාර,
අක්කරපත්තුව 08.

වගඋත්තර පාර්ශවය : 1. ප්‍රාදේශිය ලේකම්,
ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,
අලයාඩිවෙම්බු.

2. ග්‍රාම නිළධාරි,
කෝලාවිල් 01 වසම බාර,
ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,
අලයාඩිවෙම්බු.

3. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
බගවන්තලාව.

4. දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර.

<u>පැමිණිලි අංකය : **HRC/AM/43/18**</u>.

**පැමිණිල්ලලේ සඳහන් කරුණු :-**

පැමිණිලිකාර පි.එච්. අබේවික්‍රමසිංහ මහතා කොමිෂන් සභාව වෙත අවස්ථා දෙකකදි තමන්ට සිදුවී ඇති අසාධාරණයන් සම්බන්ධව පැමිණිලි ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු සිය මුල් පැමිණිල්ල 2018.06.07 දින ඉදිරිපත් කර ඇති අතර, පැමිණිලිකරු සතු අංක 267 දරණ ඔප්පු සහිත ඉඩමේ සංවර්ධන කටයුතු වලට බාධා කරන බවට ධීවර දෙපාර්තමේන්තුවේ කල්මුණ කාර්යාලයේ සහකාර

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R.A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541/ 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrcsl@gmail.com |

අධ්‍යක්ෂ ඇතුළු නිලධාරීන්ටත් අලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම්වරයාටත්, අක්කරපත්තුව පොලිස් ස්ථානාධිපතිවරයාටත් එරෙහිව සිදුකර ඇත.

මෙකී පැමිණිල්ල පිළිබඳව විභාගය 2018.07.12 දින වගඋත්තර පාර්ශවයේ සහභාගීත්වයෙන් සිදුකර ඇති අතර, පැමිණිල්ල සතු ඔප්පු ඉඩම තුළ සංවර්ධන කටයුතු කිරීම ඔහු විසින් නීත්‍යානුකූලව සිදුකරන බවත්, එකී ඉඩම ධීවර දෙපාර්තමේන්තුවට හෝ වෙනයම් පාර්ශවයකට හිමිකම් නොමැති බවත්, මෙම පරීක්ෂණයේදී අනාවරණය වී ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ ඉඩමේ කටයුතු සඳහා බාධා කිරීම් නොකරන ලෙසත්, ඉඩම තුළ ඇති ගොඩනැගිලි හා දේපළ සම්බන්ධයෙන් ධීවර දෙපාර්තමේන්තුව අයිතිවාසිකම් කියන්නේ නම් අධිකරණය වෙත එළඹෙන ලෙසත් එහිදි ධීවර දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර පාර්ශවයන්ගේ එකඟතාවය මත ඊට අදාළ නිරීක්ෂණ වාර්තාවක් 2018.07.24 දින නිකුත් කර ඇත. විශේෂයෙන්ම පැමිණිලිකරු සතු අංක 267 දරණ ඉඩමට යාබද රජයේ මැනුම් නොකළ ඉඩම් හඳුනා ගැනීම සඳහා මැනුම් කරන ලෙසත් එහිදි ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත.

ඉන්පසුව පැමිණිලිකාර අබේවික්‍රමසිංහ මහතා විසින් 2020.10.25 දිනැතිව නැවත කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, එකී පැමිණිල්ට අනුව ඔහු සඳහන් කර ඇත්තේ, කලින් ධීවර දෙපාර්තමේන්තුව මැදිහත්වීම හේතුවෙන් කරන ලද පැමිණිල්ල අනුව ධීවර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් තමන්ගේ ඉඩමේ කටයුතුවලට බාධා නොකළ බවත්, එහෙත් ඉහත 01,02 පිළිවෙලින් ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිළධාරි විසින් ඔහුගේ ඔප්පු සහිත ඉඩමේ සංවර්ධන කටුයුතුවලට දිගින් දිගටම බාධා කරන බවත්ය.

ඒ අනුව වගඋත්තර ප්‍රාදේශීය ලේකම් වෙත 2020.11.04 දිනැතිව වාර්තාවක් යොමු කරමින් අප විසින් මීට පෙර නිකුත් කරන ලද නිරීක්ෂණ වාර්තාව අනුව අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-**

වගඋත්තර පාර්ශවීය ප්‍රාදේශීය ලේකම් විසින් කොමිෂන් සභාව වෙත 2020.11.17 දින වාර්තාවක් යොමු කරමින් පැමිණිල්ලට අදාළව පැමිණිලිකරුගේ ඉඩම්වලට යාබද කලපු රක්ෂිත මැනීම සඳහා මැණුම් නියෝගයක් යවා ඇති බව දන්වා ඇත.

වගඋත්තර අලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම්වරයා 2021.02.24 දින නැවත මෙම කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එහි දක්වා ඇත්තේ පැමිණිලිකරු හිමිකම් කියන අංක 267 දරණ ඉඩම ජලයෙන් පිරී ඇති බවත්, මායිම් හඳුනා ගැනීමට ඉතාම අපහසු බවත් එම ඉඩම වෙරළ ආරක්ෂක කලාපය තුළ පවතින බවත්ය.

විමර්ශනයේදි අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු තමා සතු අංක 267 දරණ පැහැදිලි මැණුම් සිතියම් සහිත ඉඩම සඳහා අයිතිවාසිකම් කියන අතර එම ඉඩම නීත්‍යානුකූල මැණුම් කරන ලද පැහැදිලි මායිම් සහිත ඉඩමක් බව අනාවරණය වේ.

පැමිණිලිකරු සතු ඉඩමේ සංවර්ධන කටයුතුවලට බාධාවන ලෙස ධීවර දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබූ අතර, කොමිෂන් සභාවේ මැදිහත්වීම මත එම බාධා ඉවත් වී ඇත. පැමිණිලි විමර්ශනයේදි අනාවරණය වී ඇත්තේ, පැමිණිලිකරු සිය ඔප්පු සහිත ඉඩමේ මායිම් තුළ කටයුතු කරන බවයි. එම අවස්ථාවේදිද මෙහි වගඋත්තර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අදාළ ප්‍රදේශයේ රජයේ ඉඩම් හඳුනාගැනීම සඳහා ඉඩම් මැනුම් කිරිමට කටයුතු කරන බව කොමිසම වෙත දන්වා සිටියද එකී කටයුතු සිදුකර නොමැති බව අනාවරණය වේ.

එසේ තිබියදි වගඋත්තර ප්‍රාදේශීය ලේකම්වරයා හා ග්‍රාම නිළධාරීවරයා විසින් දිගින් දිගටම පැමිණිලිකරු සතු ඉඩමේ සංවර්ධන කටයුතු වලට බාධා කරමින් කටයුතු කරන බව පැමිණිලි පාර්ශවය දන්වා සිටි අතර, පැමිණිලිකරුගේ ඉඩමේ සංවර්ධන කටුයුතුවලට බාධා නොකරන ලෙස කොමිෂන් සභාව විසින් දැනුම්දීම් කර ඇත.

එසේම පැමිණිලිකරු සතු  ඔප්පු සහිත ඉඩම වෙරළ සංරක්ෂණ කළාපයට පිටතින් පවතින බවටත්, එය වෙරළ සංරක්ෂණ කලාපයට අයත්දැයි කීව නොහැකි බවත් දන්වා  ඇත.

මේ අතර පැමිණිලිකරු විසින් සිය ඔප්පු සහිත ඉඩමේ නල ලිඳක් ඉදිකිරිම සඳහා වගඋත්තර  ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2020.09.28 දින නිර්දේශය ලබාදි ඇති බව අනාවරණය වේ. එහිදි ඉඩමේ මායිම් පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයාටද ගැටළුවක්වී නොමැති බව අනාවරණය වේ.

පැමිණිලිකරු අදාළ ඉඩමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ඉදිකිරිම් සිදුකිරීමට යාමේදි වගඋත්තර පාර්ශවය විසින් දිගින් දිගටම සිදුකරන බාධා නිසා ඔහුගේ අයිතිවාසිකම් කඩවන බවට පැමිණිලිකරු 2021.10.04 දින නැවත කොමිෂන් සභාව වෙත දන්වා ඇත.  වගඋත්තර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 03 වන වගඋත්තර පාර්ශවීය අක්කරපත්තුව පොලිසිය වෙත 2021.09.16 වාර්තාවක් යවමින් පැමිණිලිකරුගේ ඉඩමේ සිදුකරන සංවර්ධන කටයුතු නවත්වන ලෙස දන්වා ඇති බව අනාවරණය වන අතර, එකී ලිපියේ වගඋත්තර ප්‍රාදේශීය ලේකම්ට පැමිණිලිකරුගේ ඉඩම ආසන්නයේ ඇති කලපුව අයත් ඉඩම් හඳුනා ගැනීමට ලියකියවිලි නොමැති බවට සඳහන්ව ඇත.

පැමිණිලිකරු විසින් 2021.10.12 දින නැවත කොමිෂන් සභාව වෙත කරුණු දක්වමින් වගඋත්තර ප්‍රාදේශීය ලේකම්වරයා  විසින් තමන්ගේ ඉඩමේ කටයුතුවලට බාධා කිරිමෙන් තමාගේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට නොහැකි වීමෙන් අගතියට පත් කර ඇති බව දන්වා ඇත. එකී කරුණු දැක්වීමේදි පැමිණිලිකරු වැඩිදුරටත් දන්වා ඇත්තේ, 2018 වසරේදි තමාගේ ඉඩමට අනවසරයෙන්

ඇතුලු වී අලාභ හානි සිදු කළ අය විසින් අධිකරණයේදි සමාව ගෙන වන්දි මුදල්ද ගෙවූ බවත්, එහෙත් වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් පැමිණිලි පාර්ශවය මානසික හිංසනයට පත්ව ඇති බවත්ය.

වගඋත්තර පාර්ශවීය ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දිගින් දිගටම ප්‍රකාශ කරන කරුණක් වන්නේ ප්‍රෙද්ශයේ ඉඩම්/රක්ෂිත හදුනා ගැනීම විශාල පිරිවැය සහිත දීර්ඝ කාර්යයක් බවයි. එහෙත් වගඋත්තර ප්‍රාදේශීය ලේකම් විසින් ඒ සඳහා සැලසුමක් ඉදිරිපත් කර නොමැත. 2018 වසරේදි ධීවර දෙපාර්තමේන්තුවට එරෙහි පැමිණිලි විභාගයේදිද ඒ පිළිබඳව කරුණු දැක්වූ අතර, ඒ සඳහා මැණුම් නියෝගයක් යවා ඇත්තේ 2021 වසරේදි බව අනාවරණය වේ. එසේ තිබියදි මායිම් හදුනාගැනීමට නොහැකි බව දන්වමින් පැමිණිලිකරුගේ ඉඩම තුළ සිදුකරන සංවර්ධන කටයුතුවලට වගඋත්තර පාර්ශවය බාධා පමුණුවන බව අනාවරණය වේ.

වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ ඉඩම සම්බන්ධයෙන් සිදුකරන මැදිහත්වීම සම්බන්ධ අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයා වෙත පැමිණිලි පාර්ශවය මෙන්ම කොමිෂන් සභාව විසින්ද දැනුම්දීම් කර ඇතත්, ඒ සම්බන්ධයෙන් විධිමත් පියවරක් ගෙන නොමැති බව අනාවරණය වේ.

**විමර්ශනය :-**

පැමිණිලිකරු අයිතිවාසිකම් කියනු ලබන ඉඩමේ මුල් ඔප්පුව 1958 අංක 9314 යටතේ පැවරුම් කරන ලද්දක් වන අතර, 2017.08.13 දින එකී මුල් ඔප්පුවෙන් වෙන් කරන ලද අක් 01 රූඩ් 01 පර්චස් 20 ක් සඳහා අංක 267 දරණ ඔප්පුව ලබා දී ඇත. ඒ සඳහා මිනින්දෝරු සිතියම් අංක SNR/2017/3241/C දරණ මැණුම් සිතියමද ලබා දී ඇති අතර එහි නිරවුල් මායිම් සඳහන්ය.

එතැන් සිට පැමිණිලිකරු අදාළ ඉඩමේ ව්‍යාපාර කටයුතු සඳහා ඉඩමේ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති අතර, ඒ සඳහා නොයෙක් බාධාවන් ඇති වී ඇත. ඒ සඳහා රාජ්‍ය මැදිහත්වීමක් වශයෙන් ධීවර දෙපාර්තමේන්තුව මැදිහත්වී තිබූ අතර, කොමිෂන් සභාවේ මැදිහත්වී මත එම බාධාවන් ඉවත් වි ඇත. ඉන්පසුව වගඋත්තර ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරීන් විසින් බාධාකිරීම් සිදුකර ඇති අතර නීත්‍යානුකූල පදකමකින් තොරව පැමිණිලිකරුගේ ඉඩමේ සංවර්ධන කටයුතුවලට බාධා සිදු කරනු ලබන බව අනාවරණය වේ. ඒ සඳහා පොලිස් සහාය ලබා ගැනීමටද කටයුතු කර ඇති අතර, පොලිස් පරික්ෂණවලදිද පැමිණිලිකරු සංවර්ධන කටයුතු කිරිමේදි කිසිදු අනවසර අල්ලා ගැනීමක් සිදුකර ඇති බවක් සනාථ කර නොමැත. මේ තත්වය දිගින් දිගටම සිදුවීම හේතුවෙන් පැමිණිලිකරු 2017 වසරේ සිට සිය ඉඩම තුළ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරිමට නොහැකි වී ඇත. වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ ඉඩම අවට රජයේ රක්ෂිත වෙන්කර ගැනිම තවමත් නොහැකිවී ඇති අතර එසේ තිබියදි පැමිණිලිකරුගේ ඉඩමේ මායිම් තුළ සිදුකරන සංවර්ධන කටයුතුවලට නීතිවිරෝධි මැදිහත්වීම හේතුවෙන් පැමිණිලිකරු අගතියට පත්වී ඇති බව නිරික්ෂණය වී ඇත.

ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලිකරුගේ ඉඩම සම්බන්ධයෙන් කටයුතු කිරිමේදී සිය රාජකාරි බලය අයුතු ලෙස යොදවාගෙන නීතිවිරෝධිව කටයුතු කිරිමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) හා 14(උ) වගන්ති මඟින් සහතික කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) හා 14(උ) වගන්ති මඟින් සහතික කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, පැමිණිලිකරු හිමිකම් කියන අංක 267 දරණ සිතියම්ගත ඉඩමේ කටයුතු සම්බන්ධයෙන් වගඋත්තර ප්‍රාදේශිය ලේකම් ඇතුළු වගඋත්තරකරුවන් විසින් සිදුකරන නීතිවිරෝධි මැදිහත්වීම් වහාම නතර කළ යුතුය. එමෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ වගඋත්තර පාර්ශවය විසින් සිදුකරන ලද විවිධ මැදිහත්වීම් හේතුවෙන් සංවර්ධන කටයුතු සිදුකර ගැනීමට නොහැකි වීමෙන් පැමිණිලිකරු අගතියට පත්ව ඇති බැවින්, කඩිනමින් මැනුම් කටයුත්තක් සිදුකර රක්ෂිතය වෙන්කර ගැනීමටත්, ඒ අතරතුර පැමිණිලිකරුට ඔහුගේ ජීවනෝපාය කරගැනීමට වාතාවරණය ඇති කිරීමටත් කටයුතු කරන ලෙස වගඋත්තර පාර්ශවයට නිර්දේශ කරනු ලැබේ.

2022. 11. 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
අම්පාර.

B/